# තනතුරු — ඇබෑර්තු

## රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්‍ෂණ සේවා ගණයට අයත් III පන්තියේ III ශ්‍රේණියේ ඔෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරට බාහිර බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්‍ෂණ සේවා ගණයට අයත් III පන්තියේ III ශ්‍රේණියේ ඔෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරට බාහිරින් බඳවා ගැනීම සඳහා සුදුසුකම් සහිත අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*තනතුරට අයත් වැටුප් ක්‍රමය :*

මසකට රු. 14,425-10x145-11x170-6x240-14x320-රු. 23,665 ක වැටුප් පරිමාණයක් මෙම තනතුරට හිමිවේ.

*සුදුසුකම් :*

1. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
2. යහපත් චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
3. යම් ආගමික නිකායක පැවිදිවරයකු නොවිය යුතු ය.
4. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය, සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන භාෂා අතරින් මාධ්‍ය භාෂාව, විද්‍යාව ඇතුලු ව විෂයයන් හතරකට (04) අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හය (06)කින් සමත්වීම.
5. පිළිගත් ආයතනයක ආදළ ක්ෂේත්‍රයේ වසර දහයකට (10) නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම,

   (මෙම දස අවුරුදු සේවා කාලය තුළ අයදුම්කරුවන් සේවය සඳහා අර්ථසාධක අරමුදලට/විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවා තිබෙන බවට සනාථ කළ යුතු ය).
6. ක්ෂේත්‍රයට අදාළව N. V. Q. 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

*තෝරාගනු ලබන ක්‍රමය :*

සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා ඔෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර පිළිබඳව ජාතික වෘත්තීය සුදුසුකම් (N. V. Q.) 5 මට්ටමේ පරීක්‍ෂණයක් ජාතික වෘත්තීය හා තෘතියික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හෝ එම කොමිෂන් සභාව සුදුසු යැයි තීරණය කරනු ලබන ආකාරයකට පවත්වනු ලබන අතර එහි දී ප්‍රවීණතා සහතිකය ලබා ගන්නා අයදුම්කරුවන් සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක් පවත්වනු ලැබේ. එහි දී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල මත, සුදුසුකම් පරීක්‍ෂා කිරීමේ සම්මුඛ පරීක්‍ෂණයකින් ද අනතුරුව පුරප්පාඩු සංඛ්‍යාව මත සුදුස්සන් බඳවා ගනු ලැබේ. ජාතික වෘත්තීය සුදුසුකම් පරීක්‍ෂණයේ දී නියමිත ප්‍රවීණතාවය ලබාගන්නා අයදුම්කරුවන් වෙත අදාළ ප්‍රවීණතා සහතික ලබා දෙනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයෙන් සමත්වීම සඳහා අවම වශයෙන් මුළු ලකුණු වලින් ලකුණු 40% ක් ලබා ගත යුතු අතර සුදුසුකම් පරීක්‍ෂා කිරීමේ සම්මුඛ පරීක්‍ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොකරයි.

ඉහත දැක්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් (N. V. Q.) ප්‍රවීණතා සහතික මත බඳවා ගැනීමේ ක්‍රමය ජාතික වෘත්තීය හා තෘතියික අධ්‍යාපන කොමිෂන් සභාවේ සංශෝධනයන්ට යටත් වේ.

*ස්ථිර කිරීම :*

III පංතියේ III ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරියකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වේ. ඔහු/ඇය පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය සමත්ව සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 හි විධිවිධාන පරිදි භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇත්නම් හා ඔහු/ඇය පරිවාස කාලය තුල සිය රාජකාරි, වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් ඔහු/ඇය පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.

*වයස :*

අයදුම්කරුවන් වයස අවු. 30ට නොඩු හා අවු. 40ට නොවැඩි විය යුතු ය.

- මෙහි දැක්වෙන සුදුසුකම් 2015.06.05 දිනට සෑම අතින්ම සම්පූර්ණ වී තිබිය යුතු ය.
- දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් පමණක් අයදුම්පත්‍රයේ 14 වන කොටස අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතු ය.
- අයදුම්පත් මේ සමඟ ඇති ආකෘතියට අනුව සකස් කර, නිසි ලෙස සම්පූර්ණ කර ලිපි කවරයේ වම් පස ඉහල කෙළවරේ ඔෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරට බාහිර බඳවා ගැනීම සඳහා අයදුම්පත ලෙස සඳහන් කර 2015.06.05 දිනට පෙර රජයේ මුද්‍රණාලයාධිපති, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ 08 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කළ යුතු ය.
- මෙහි සඳහන් නොවන වෙනත් කරුණු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවා ව්‍යවස්ථාව අනුව තීරණය වේ.
- මෙම සේවා ව්‍යවස්ථාව යටතේ බඳවා ගනු ලබන සියලුම නිලධාරීහු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධානවලට හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවන්නා වූ නියෝග 'රෙගුලාසි' කාර්යය පටිපාටි රීතිවලට, දෙපාර්තමේන්තු විධිවිධානවලට ද, රජය විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් විධිවිධාන හා නියෝග වලට ද අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටිති.

ඩබ්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

### රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්‍ෂණ සේවා ගණයට අයත් III පන්තියේ III ශ්‍රේණියේ ඔෆ්සෙට් ලිතෝ මුද්‍රණ ක්‍රියාකරු තනතුරට බාහිර බඳවා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. මුලකුරු සමඟ නම
   - සිංහලෙන් :————.
   - ඉංග්‍රීසියෙන් :————.
3. ලිපිනය :————.
4. උපන් දිනය :————.

5. 2015.06.05 දිනට වයස ඃ අවු. :————.  මාස :————. දින :————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

7. විවාහක/අවිවාහක බව :————.

8. ජාතික හැඳුනුම්පත් අංකය :————.

9. දුරකතන අංකය :————.

10. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන බව :————.

11. අධ්‍යාපන සුදුසුකම් ඃ

අ. පො. ස. සා/පෙළ

විභාග අංකය :————. පෙනී සිටි වසර :————.

| | | | |
|---|---|---|---|
| (i) | ...................... | (vi) | ...................... |
| (ii) | ...................... | (vii) | ...................... |
| (iii) | ...................... | (viii) | ...................... |
| (iv) | ...................... | (ix) | ...................... |
| (v) | ...................... | (x) | ...................... |

අ. පො. ස. උ/පෙළ

විභාග අංකය :————. පෙනී සිටි වසර :————.

(i) ......................
(ii) ......................
(iii) ......................
(iv) ......................

12. පිළිගත් ආයතනයක සේවා පලපුරුද්ද :————.

.............................................
.............................................
.............................................
.............................................

13. වෘත්තීය සුදුසුකම් :————.

(i) ඔෆ්සෙට් ලිතෝකරණයට අදාළව NVQ ප්‍රවීණතා සහතිකය ලබා තිබේ ද? :————.

(ii) එසේ ලබා තිබේනම් ඒ කුමන මට්ටම ද? :————.

(iii) වෙනත් සුදුසුකම් :

.............................................
.............................................
.............................................
.............................................
.............................................
.............................................
.............................................
.............................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තව ද මෙහි දැක්වෙන යම් කරුණක් අසත්‍ය බව සනාථ වුවහොත් මා මෙම තනතුර සඳහා සුදුස්සෙකු නොවන බව ද, තනතුරෙන් ඉවත්වීමට ද සිදුවන බව ද මා හොඳාකාරවම දන්නා බව ද මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. දැනටමත් රජයේ සේවයේ තනතුරක් දරන අයදුම්කරුවන් පමණක් මෙහි පහත සඳහන් කොටස සම්පූර්ණ කළ යුතු ය.

ඉහත 1 සිට 13 දක්වා වූ තොරතුරු නිවැරදි බවත්, මෙම නිලධාරියා/නිලධාරිනිය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබා ඇති බවත් සහතික කරමි. තව ද මෙම නිලධාරියා/නිලධාරිනිය මෙම තනතුර සඳහා තේරී පත්වුවහොත් දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදාහැරිය හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.

දිනය :————.

15. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.—*

* අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියකු/විශ්‍රාමික ප්‍රධානියකු/කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු දිවුරුම් කොමසාරිස්වරයකු නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු රු. 240,360 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික සේවයේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙක් ලවා සහතික කරවා ගත යුතු ය.

ඉහතින් අත්සන් කර ඇති ...................... මයා./මිය. මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි.

————,
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

නම :————.

නිල නාමය :————.

ලිපිනය :————.

05-343